

# මෙතේ බුදුහු බුදුවෙති නාගසක් මුල

නා

නාග, නාගකේසර, නාග ඔලී වැනි නම් වලින් හැඳින්වෙන නාගස මෑතක සිට ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය හැටියට පිළිගෙන තිබේ. නාලන්ද, නාහල්ල, නාගොඩ, නාවිමන, නාවැටිය, නා ගිරිගල, නා දෙණිය, කහනාවිට, නාගොල්ලා ගම, නාවෙල, නාපෙ, නාවල, නාවලපීය ආදී ගම්වලට ඒ නම් සෑදී ඇත්තේ නා ගස් ඇසුරෙනි.

නාමල් රේණු, නාපොතු, නා මුල් දේශීය වෙදකමේදී ඔසු සඳහා යොදා ගැනේ. නයි විෂ හරණය සඳහා වූ ඔසු බෙහෙත් පිළියෙළ කිරීමේදී නා මල් රේණු කල්කය සඳහා යොදා ගැනේ. සුවඳ ධූප පිළියෙල කිරීමටද නාමල් රේණු ගනු ලැබේ.

පිරිත් පිංකම්වලදී මණ්ඩපයේ වියන යට නා දලු රිකිලි එල්ලීමට අමතක නොකෙරේ. මෙම මහා භද්‍ර කල්පයේ පස් වැනිව බුදු වන්න් යයි අදහනු ලබන මෛත්‍රී බුදුන් වහන්සේට සම්බෝධිය සඳහා උපකාර වන්නේ මේ නාග ශ්‍රී බෝධියයි. ඒ ගැන ජන කවියකු විස්තර කරන්නේ මෙසේය.

"පස්වන මෙකපට මුනි බුදුවීමට
ලස්සන නා බෝධිය පැන නැගුම ට
දිලිසෙන බෝධිය රිදී පැහැය වට
එක්සිය විසි රියනයි බෝ කඳ ව ට

නිතින් එ මල් පිපෙනා - මුලසිට - අගදක්වා සොබනා
එකින් එකට පෙනෙනා - කැකුළු මල් - මාදිය කල පමණා
සොඳින් එමල් පිපෙනා - මහා ගැල් - රතරෝදය පමණා
එකින් එකට මලිනා - රේණු ඇත - නැලිය නැලිය බැගිනා

"එදා පිපෙන මල් පරවී නොතිබෙයි - අසූ දහස් අවුරුදු පමණා
මෙතේ මුනිඳු පිරිනිවනට පැමිණෙයි - එදා පරව මල් නටුවෙන් ගැලවෙයි."

"නටුවෙන් ගැල වෙමින් එමල් පෙති - අහසින් යන ගම නේ
සුළඟින් ගෙන ගොසිනේ - එනාමල් - දරසෑයේ වැටෙ නේ
මුනිඳුන් සමඟ අනේ - එදිනම - ආදාහන වන් නේ
මෙලෙයසි රුව වරුණේ එනාගස් - ශ්‍රී මහ බෝ රජු නේ

නාමලින් බුදුන් පුදන්නට සැදැහැතියෝ මහත් රුචියක් දක්වති. ඒ ගැන තවත් ජන කවියෙක් මෙසේ පවසයි.

"රුක් මල් පිදුවේ රුව වැඩි වෙන්ඩයි
වන මල් පිදුවේ වදෙන් මිදෙන්ඩයි
රත් මල් පිදුවේ රතේ ලබන්ඩයි
නාමල් පිදුවේ නිවන් දකින්ඩයි"

පරගොඩ විහාරයට නාමල් පිදීමට ගිය ගමනක් ගැන මාටින් වික්‍රමසිංහ මහතා ගම්පෙරළිය නව කථාවේ විස්තරයක් කරයි. වෙනත් ජන කවියෙක් නාමල් ගැන මෙසේ සඳහන් කරයි.

"මලේ මලේ අර නා මල නෙලා වරෙන්
අත්ත බිඳෙයි පය බුරුලෙන් තබා වරෙන්
සාදු කාර දී ඔරුවක නැගී වරෙන්
කැළණි ගඟේ ඔරු යනවා බලා වරෙන්

අපේ ඇතැම් කවියෝ යුවතියක ගේ රත් පැහැ දෙතොල් නා දලු වලට උපමා කළහ. දහම් සොඬ කවේ අලගිය වන්නයෝ මෙසේ වණති.

"රතදරිනි නා ලිය
ගමනින් සදිසි නාලිය
එපුර සරණ ලිය
කවුර උනම් හැකිවෙති වනාලිය"

වසන්ත කාලයේ දිදුලා පිපුණු නාගස බුදුන් වැඩි අන්දම සසදා වත මෙසේ වර්ණනා කරයි.

කිසල් සුපුල් මල - වල වජඹනා නා තුරු
මුදුන්හි තබා පලන් - වන් මුණි සරණ නියරුස්

සැළලිහිණි සංදේශයේ දී රහල් හිමියෝ කැළණි ගඟ දෙපස වූ විවිධ ශාක අතර නා ගස්ද දකිති.

"සල් සපු කිත දොඹ රූ
රග නා මිදෙලි
පොල් පුවකුඟු රඹ මල
බුලත මත කලී
පුල් එරහැදි හෝ
පලුවීර සලි මලි
නිල් ගනසා සෙවනලු
දෙතෙර මනකලි"



විශ්‍රාමලත් විදුහල්පති
ශාස්ත්‍රවේදී
**නා.ලි. සාර්ලිස් අමරසිරි**

නා ගසේ අරටුව ඇතත් සාමාන්‍ය මිනිසුන්ගේ නිවෙස් තැනීමේදී නා ලී භාවිතයට නොගැනේ. සමහර විට නා ගස දෙවියන් අරක් ගන්නා ගසක් හැටියට විශ්වාස කරන නිසා විය හැකිය. විහාර, දේවාල, අම්බලම් ආදිය තැනීමේදී නා අරටු යොදා ගෙන ඇත. ඇම්බැක්ක දේවාලයේ ලී කැටයම් කර ඇත්තේ නා ලී වල බව පිළිගැනේ. ගල් කණු මත නා ලී බාල්ක යොදා ගොඩ නැගූ ටැම්පිට විහාර හා දේවාල නොයෙක් ප්‍රදේශ වල ඇත. පැරණි මැදගොඩ දේවාලය ගොඩ නගා තුබුනේ එසේය. බොහෝ විහාර දේවාල ඉඩම් වල විශේෂයෙන් නා ගස් වවා තිබෙනු දක්නට ඇත.

---

# උත්තරීතර ධර්මය ලොව පහළ වුණ ඇසළ පෝය



**ප්‍රේමසේන ලුණුගම**
විශ්‍රාමික විදුහ්පති - සාම විනිසුරු

වෙසක් සඳ අහසේ උදාවනවිට සම්මා බුදුවරයකු පිළිබඳ ශ්‍රේෂ්ඨතම ඓතිහාසික සිද්ධීන් රැසක් අපගේ මතකයට නැගී එයි. පොසොන් සඳ අහසේ උදාවෙන විට අනුබුදුවරයෙකු පිළිබඳ සහන් අපගේ මතකයට නැගී එයි. ඇසළ සඳ අහසේ අදාවුණු තෙරුවන් ලොව පහළවුණු දිනය වශයෙන් අපගේ සිතට සිහිපත් වෙයි. බුදු දහම නැමැති මිණි පහන දැල්වී එයනි ලෝකය ආලෝක වූ සැටි, බුද්ධ ශාසන රත්නත්‍රය මතුවී සසුන් ගුණ රුවමින් තුන් ලොව සැනසී ගිය සැටි, බුදු හිමි මුව ගැබින් වැගිර ගලා ගිය දහම් අමා වහරින් මුළු ලොව තෙමී දුක් ගිනි නිවී සැනසී ගිය හැටි, මිනිස්, දෙවි බඹුන්ගේ සාධු නාදයෙන් මුළු මහත් මිගදාය උතුරා ගලා ගියහැටි, බුදුරැස් දහරින් බරණැස ඉසිපතනය නැහැවී ගිය සැටි, ආතියා ලෝකයේ කැළුම් දහරා විහිදී පැතිරී ගිය සැටි අද වැනි ඇසළ පෝය අපහට සිහිපත් කරයි.

ලෝකයාට සම්‍යක් දර්ශනය පහළවුණු දිනය ඇසළ පුන් පොහෝදායි. දෙසැටක් මිස දිටු නැමැති දැලෙහි පැටලී නානා ප්‍රකාර අත්කිලමථානු යෝග ක්‍රමවල හා කාමසුඛල්ලිකානු යෝග ක්‍රමවද ගැලී සිටි ලෝකයාට මධ්‍යම ප්‍රතිපදාව නම් වූ උතුම් ජීවන මාර්ගයක් දේශනා කළ දිනය ඇසල පුනු පොහෝදායි. ලෝකයාත් සත්වයාත් හේතු ප්‍රත්‍යයන්ගෙන් උපන් බව දේශනා කරමින් හේතුඵල වාදය අනුගමනය කළ න්‍යායවාදී ශාස්තෘවරයාණන්ගේ උත්තරීතර ධර්මය ලොව පහළවුණු දිනය ඇසළ පුනු පොහෝදායි. දුකත්-දුකට හේතුවත් නිවනත් එය ලබන පිළිවෙතත් යන සත්‍ය සතර ලොව දේශනා කළ දිනය ඇසළ පුනු පොහෝදායි. විශාලතම සමාජ විපර්යාසයක්, බුද්ධි විප්ලවයක්, ආගමික උද්යෝගයක්, චින්තන ප්‍රබෝධයක් ඇතිකළ දිනය ඇසළ පුනු පොහෝදායි. ශාතිවක දෘෂ්ඨිය, උච්තර්ද දෘෂ්ඨය යන දෘෂ්ඨිවාද දෙක පරම නිශ්ඨාව වශයෙන් සළකාගෙන සිටි ලෝකයාට යථභූත ඥාණ දස්සනය පහළ වූයේ ඇසළ පුනු පොහෝදායි.

වෙසතුරු අත් බැවින් පසු තුසිත දෙව්ලොව ඉපදුණු බෝසතාණන් වහන්සේ දෙව් බඹුන් ගේ ආරාධනා පිළිගෙන පස්වහ බැළුම් බලා දඹදිව මධ්‍ය දේශයෙහි කපිල වස්තු පුරයෙහි සුද්ධෝදන ශාක්‍ය රජතුමාගේ අග මෙහෙසිය වන මහාමායා දේවිය කුස පිළිසිඳ ගත්තේත් ඇසළ පුනු පොහෝ දිනකය. එකුන් තිස් වියේ (අවුරුදු 29දි) දී ලෙඩකු, මහල්ලකු, මළ මිණියක්, මහණ රුවක් යන ෂතර පෙර නිමිති දැක ගිහිගෙය කළකිරී අභිනිෂ්ක්‍රමණය කරන ලද්දේත් ඇසළ පුනු පොහෝ දිනකය. බුදු රදුන් ඇතුළු පස්වග මහණුන්ගේ ප්‍රථම වසසුපගමනය බරණැස මිගදාය නම් වූ ඉසිපතනයේ සිදු වුනෙත් ඇසළ පුනු පොහෝ දිනකය. රාහුල කුමරුන්ගේ උපත සිදුවූයේත් ඇසළ පුනු පොහෝ දිනකය. බුදුරදුන් ගණ්ඩම්බ රුක් මුල්හිදි තීර්ථකයන්ගේ මානය මර්දනය කරනු පිණිස යමා මහ පෙළහර දැක්වූයේත් ඇසළ පුනු පොහෝ දිනකය. එසේ ප්‍රාතිහාර්ය දක්වා සත්වැනි වස ගත කිරීමට තව්තිසා දෙව් ලොවට වැඩම කොට වස් එළඹ මාතෘ දිව්‍ය රාජයා ප්‍රධාන දෙවියනට විජම් --- වදාලේත් ඇසල පුනු පොහෝ දිනකය. සම්බුද්ධ පරිනිර්වාණයෙන් තුන් මසකින් තෘතීය ශ්‍රාවක, මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ප්‍රධාන පන්සියයක් මහ රහතන් වහන්සේලා විසින් අජාසත් රජුගේ දායකත්වයෙන් හා --- සංවිධානත්වයෙන් රජගහ නුවර වේභාර පර්වතයෙහි ධර්ම මණ්ඩපයෙහිදි ප්‍රථම ධර්ම සංගීතිය පැවැත්වීම සඳහා රජගහ නුවරට වැඩම කොට වස් එළඹ මූලික කටයුතු ආරම්භ කරන ලද්දේත් ඇසළ පුනු පොහෝ දිනකය. බු:ව: 236 වැන්නෙහි දෙවන පෑතිස් නිරිදුන් විසින් තපෝවක චේතිය වටා කරවූ ඇටසැට ලෙන් පූජාව හා දෙසැටක් රහතන් වහන්සේලා ගේ ප්‍රථම වස් එළඹිම සිදු වූයේත ඇසළ පුනු පොහෝ දිනකය. බු:ව: 382 දී දුටුගැමුණු රජතුමා විසින් රුවන්වැලි සෑ රදුන් තනන්නට මගුල් ගල් තැබීම උත්සවශ්‍රියෙන් සිදු කරන ලද්දේත් ඇසළ පුනු පොහෝ දිනකය.

එසේම උතුරු සළ නැකතින් මහා සෑයෙහි ධාතු නිදානය අනේකප්‍රකාර ප්‍රාතිහාර්ය මැද සිදු වූයේත ඇසළ පුනු පොහෝ දිනකය. බු:ව: 847 දී කිත්සිර මෙවන් රජු දවස කළිගු රටින් හේමාමාලා කුමරිය හා දන්ත කුමරුන් විසින් ගෙනෙන ලද දළදා ස්වාමීන් වහන්සේ ප්‍රදර්ශනය කරමින් වර්ෂයක් පාසා සිදු කරගෙන එනු ලබන දළදා පෙරහැරේ ආරම්භය සිදු වුයේත් ඇසළ පොහෝ දිනකය. විශේෂයෙන් ලාංකික ජනයාගෙන් වැඳුම් පිදුම් ලබන නාර-ස්කන්ධ කුමාර-පත්තිණි ආදි දෙවියන් උදෙසා පුද පූජා පවත්වා දෙවි වරප්‍රසාද ලබාගෙන ශ්‍රී සමෘද්ධිය අයත් කරගනු පිණිස ඈත අතීතයේ සිටම මහනුවර - ශ්‍රී ජයවර්ධනපුර - අළුත් නුවර - නවගමුව - දෙවුන්දර- රත්නපුරය - කතරගම ආදී නගර ග්‍රාමයන්හි පිහිටි දේවස්ථානයන්හි වාර්ෂික වශයෙන් පැවැත්වෙන දේව පූජා පෙරහර සිදුකරන ඇසළ පොහෝ දනිය නිමිති කරගෙන සිදු කරන නිසාත් ආගමික වශයෙන් මෙන්ම ඓතිහාසික අංශයෙන්ද ශ්‍රේෂ්ඨ දිනයක් වශයෙන් මෙම දවස සැළකිය හැකිය.

ඇසළ මාසය ඈත අතීතයේ සටම දෙවියනට පුද පෙරහර පවත්වන දේවාරාධනයට සැරසෙන ශුද්ධ මාසයක් වශයෙන් ද සම්මත වී අත. වෙසක් පොසොන් උත්සව දෙක හැරුණු විට ලංකාවේ පැවැත්වෙන දී ව්‍යාප්ත --- ඇසළ උත්සවයට සමකළ හැකි කිසිදු උත්සවයක් වෙනත් නොමැත. මහනුවර දළදා සමිදු උපහාර ලෙස නැකැත් අනුගමනය කරමින් වර්ෂයක් පාසා නොකඩවා පැවැත්වෙන ඇසළ පෙරහැර නැතහොත් දළදා පෙරහැ වැනි උත්සව නිසා අනෙක් පුනු පොහොය දිනයන්හි එළඹෙන මාසයන්ට වඩා ඇසළ පොහොය උදාවෙන ශුද්ධ මාසය දෙවි පුද සඳහාම වෙන් කෙරුණු විවිධ උත්සව විශේෂයන්ගෙන් පිරුණු මාසයක් වශයෙන් බෞද්ධ අබෞද්ධ හැම දෙනා විසින්ම පිළිගනු ලැබේ. මහනුවර අසැළ පෙරහැරට බෞද්ධ ස්වරූපයක් ගැන්වීම පිණිස නාථ-විෂ්ණු-කතරගම-පත්තිනි- යන සතර දේවාලයන්හි පෙරහර සතරට මුලින් දළදා පෙරහැර එක්වීම එහි දක්නට ඇති විශේෂ ලක්ෂණයකි.

එදා දඹදිව පැතිර පැවති සංස්කෘතීකන් යටපත් කරමින් බෞද්ධ සංස්කෘතිය පැතිරෙන්නට විය. විවිධ හැගීම් හා බලපෑම් නිසා සංකීර්ණත්වයට පත්ව සිටි ජනතාවගේ චින්තන පරම්පරාව අමුතු මගකට හරවන්නට බුද්ධ ධර්මයේ හා බෞද්ධ සංස්කෘතියේ ආරම්භයත් සමගම පුළුවන් විය. කුළ භේද, පන්ති භේද, ජාති භේද හා ආගම් භේද ආදී විවිධ භේදයන්ගෙන් කොටස් වී සිටි භාරතීය සමාජයට තථාගතයන් වහන්සේ වැනි උත්තරීතර මානුෂික ගුණයන්ගෙන් යුත් උතුමකුගෙන් විශාල පරිවර්තනයක් උදාර සේවයක් ඉටු විය. එසේම දඹදිව මධ්‍ය ඔන්ඩලයේ ප්‍රබල රජකුගේ පුත්‍රයකු වූ උන්වහන්සේගෙන් ඒ අහිංසකවාදී විමුක්ති සටනේ ආරම්භය ඇසළ පුනු පොහෝ දින මිගදායේ ඉසිපතන නම්මහා ජය භූමිය, පුණ්‍ය භූමිය තුළින් ආරම්භ විය.

පොහොය වර්ණනාව ග්‍රන්ථය ඇසුරෙනි.

PREMASENA LUNUGAMA
04, LOHBARD ST ROXBURGH PARK 3064
T.P. 03-83390812